GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2012/10/24

# මාධ්‍ය නිවේදනයයි

ජාතික වැටුප් කොමිසම මඟින් රාජ්‍ය සේවයේ වැටුප් නියාමනය කරනු ලබයි. මෙම කොමිසම මඟින් විද්‍යානුකුල ක්‍රමවේදයකට අනුව රාජ්‍ය සේවයට ඇතුලත් සියළුම සේවක කොටස් නියමිත වූ වැටුප්තල වල පිහිටුවා ඇත. නමුත් මෙහි පහලම හා ඉහලම වැටුප් ලබන ශ්‍රේණීන් හි වැටුප් තල අතර අනුපාතය 1:4 මට්ටමේ පැවතීම නිසා රාජ්‍ය සේවයේ සියළුම අංශ මේ වන විට බරපතල අර්බුදයකට මුහුණ දී ඇත.

එමෙන්ම වසර 2006 න් පසු මූලික වැටුපේ කිසිදු වැඩිවීමක් මේ දක්වා සිදුවී නොමැති හෙයින් මෙම අර්බුදය තව දුරටත් තීව්‍ර වී ඇත.

රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය ඉහත ගැටළුව විවිධාකාර අවස්ථාවලදී පෙන්වා දී ඇති අතර රාජ්‍ය සේවයේ අවම හා උපරිම වැටුප් 1:12 අනුපාතයකට යොමු වීම තුලින් මෙම ගැටළුව නිරාකරණය කර ගැනීමට හැකි බව අවධාරනය කර ඇත. මුදල් අමාත්‍යාංශයද, ජාතික වැටුප් කොමිසමද, මෙම වැටුප් අර්බුදයට විසඳුමක් 1:12 වැටුප් අනුපාතය බිහිකිරීම තුලින් ලබා ගත හැකි බව පිලිගෙන ඇත. රජය මෙම කරුණු දැඩි අවධානයට යොමු කිරීමෙන් අනතුරුව ඉහත ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කල යුතු බව රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය වශයෙන් අවධාරනය කරනු කැමැත්තෙමු.

තවද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන අංක 22/99 අනුව රජයේ වෛද්‍ය නිලධාරින්ට සමාන්තර රාජ්‍ය සේවයේ අනෙකුත් ශ්‍රේණි වලට දැනටමත් හිමි වී ඇති නිල ප්‍රවාහන පහසුකම හදිසි හා අත්‍යාවශ්‍ය සේවාවන් පත්වාගෙන යන වෛද්‍යවරුන්හට ලබාදීම තුලින් සාධාරණය ඉටු කිරීමට රජය බැඳී සිටින බව අපගේ විශ්වාසයයි.

එහෙයින් මේ වන විටත් පවතින වැටුප් විෂමතාවන් දුරු කිරීමටත්, වෛද්‍යවරුන්ට හිමිවිය යුතු බව දැනටමත් පිලිගෙන ඇති දීමනා සියල්ල ලබා දීමටත් රජය වහාම කටයුතු කල යුතුව ඇත.

ඉතිහාසය පුරාවටම බොහෝ විට රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය වෘත්තිය ගැටළු විසඳීම සඳහා සාකච්ඡාමය පියවර ගත් අතර එමඟින් සාර්ථකව ගැටළු විසඳාගනු ලැබුව නමුත් මේ වන විට වෘත්තිය සමිති ක්‍රියාමාර්ගවලට අවතිර්ණ වීමකින් තොරව ගැටළුව විසඳීමට නොහැකි තත්වයක් උද්ගතවී ඇත.

ඉහත ඉල්ලීම් ලබා ගැනීම සඳහා මූලික වෘත්තිය ක්‍රියාමාර්ගයක් ලෙස දිප ව්‍යාප්ත සංකේත වැඩ වර්ජනයක් 2012/10/25 දින පෙ.ව 8.00 සිට පුරා දිනයක් පැවැත්වීමට රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය තිරණය කර ඇති අතර මේ සඳහා නිසි ප්‍රතිචාර නොදැක්වුවහොත් ඉදිරියේදී දැඩි වෘත්තිය ක්‍රියාමාර්ග වලට එලඹෙනු ඇත.

මෙම කාලය තුලදී අත්‍යාවශ්‍ය හා හදිසි ප්‍රතිකාර පමණක් සිදුකරනු ලබන අතර රිජ්වේ ආර්‍ය්‍යා ළමා රෝහල, කාසල් වීදියේ කාන්තා රෝහල. ද. සොයිසා කාන්තා රෝහල, මහරගම පිළිකා රෝහල, සිරිමාවෝ බණ්ඩාරනායක ළමා රෝහල යන රෝහල් වල පමණක් මෙම වෘත්තිය සමිති ක්‍රියා මාර්ගය ක්‍රියාත්මක නොවන බව දැනුම් දීමට කැමැත්තෙමු

ස්තුතියි

වෛද්‍ය චන්දික එපිටකඩුව
ලේකම්

| | |
|---|---|
| වෛද්‍ය නලින් ආරියරත්න | 0714800942 |
| වෛද්‍ය නවීන් ද සොයිසා | 0718582444 |
| වෛද්‍ය ලසන්ත පිනදාස | 0773625788 |
| වෛද්‍ය නලින්ද හේරත් | 0717876516 |